**ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සහ එහි පරිපාලිත සමාගම් - 2016**

**------------------------------------------------------------------------**

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සහ එහි පරිපාලිත සමාගම්වල 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**-------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**------------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ සහ එහි පරිපාලිත සමාගම්වල මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ සහ පරිපාලිත සමාගම්වල අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය

තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවැරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**---------------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

**--------------------------------**

**2.1.1 සමූහය**

**---------**

මෙම වාර්තාවේ 2.2 හා 2.3 ඡේදවල දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සහ එහි පරිපාලිත සමාගම්වල මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට හා කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.1.2 අධිකාරිය**

**-----------**

මෙම වාර්තාවේ 2.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම් - සමූහය**

**-------------------------------------------------------**

**2.2.1 මූල්‍ය ප්‍රකාශන ඒකාබද්ධ කිරීම**

**----------------------------------**

අධිකාරිය සහ පූර්ණ හිමිකාරිත්වය සහිත පරිපාලිත සමාගම් 03 ක් ඒකාබද්ධ කර ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සකස් කර තිබුණු අතර එක් සමාගමක් ඇවරකරමින් පැවතුණි. එයින් ණයහිමියන්ට ගණන්බේරා වසාදැමීමේ කටයුතු සිදුකරනු ලබන මහවැලි වෙන්චර් කැපිටල් ( පුද්) සමාගමේ රු.15,510,548 ක වත්කම් හා රු. 406,708 ක වගකීම් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත්කර නොතිබුණි.

### 2.2.2 කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රමිතයෙහි 17 පරිච්ඡේදයේ 17.19 වන වගන්තිය පරිදි මහවැලි උපදේශක සේවා කාර්යාංශ (පුද්ගලික ) සමාගමේ ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.3,519,602 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මහවැලි පශු සම්පත් සහ කෘෂි ව්‍යාපාර (පුද්ගලික) සමාගම විසින් ප්‍රමිතයෙහි 3 පරිච්ඡේදයේ 3.8 වන වගන්තිය ප්‍රකාරව සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳව හා 33 පරිච්ඡේදයේ 9 වගන්තිය ප්‍රකාරව සමාගමට සම්බන්ධිත පාර්ශවයන් පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) ස්වාභාවික සම්පත් කළමනාකරණ සේවා (පුද්ගලික) සමාගම විසින් ප්‍රමිතයෙහි 4 පරිච්ඡේදයේ 4.5 වගන්තිය ප්‍රකාරව මාස හයකින් කල්පිරෙන රු. 6,926,566 ක ස්ථාවර තැන්පතු ජංගම වත්කම් ලෙස දැක්විය යුතු වුවත් ජංගම නොවන වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මහවැලි උපදේශක සේවා කාර්යාංශ ( පුද්ගලික ) සමාගම එකතුකළ අගය මත බදු රහිතව විදේශ විශේෂඥයින්ට මාර්තු මාසයේ උපදේශක ගාස්තුව ලෙස රු.4,135,400 ක් ගෙවා තිබුණද එහි ඇතුලත් නොවූ රු.539,400 ක එකතුකල අගය මත බද්දක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු බදුවලින් හිලව් කර ගනිමින් ගිණුම් තැබීම නිසා මූල්‍ය ප්‍රකාශනවල උපදේශක ගාස්තු වියදම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) මහවැලි පශු සම්පත් සහ කෘෂි ව්‍යාපාර (පුද්ගලික) සමාගම

(i) ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත නිදහස්කර තිබුණු කළමනාකරණ සහකාරවරයෙකු වෙනුවෙන් 2010 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා සමාගමේ අරමුදලින් ගෙවන ලද රු.1,242,000 ක වැටුප් අධිකාරියෙන් ලැබියයුතු ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ii) හඳුනානොගත් අන්තර් ගොවිපල ණයගැති ශේෂ වටිනාකම රු.35,682,485 ක් අවිනිශ්චිත ගිණුමක ඇතුලත් කර සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුලනය කර තිබුණි.

(ඇ) ස්වාභාවික සම්පත් කළමනාකරණ සේවා ( පුද්ගලික ) සමාගම

(i) ධාරණ අගය ශුන්‍ය වූ පිරිවැය රු.865,700 ක් වටිනා පරිගණක හා පරිගණක උපකරණ සමාලෝචිත වර්ෂයේදී විකුණා තිබුණද ඒවායේ පිරිවැය සහ සමුච්චිත ක්ෂය අදාල ගිණුම්වලින් ඉවත් කර නොතිබුණි.

(ii) රාජ්‍ය බැංකුවකින් ලබාගෙන තිබුණු රු.600,000 ක ණය මුදල 2016 ජනවාරි 11 දින පොලිය සමඟ සම්පූර්ණ මුදලම පියවා තිබුණද ඊට අදාල රු.14,748 ක ණය පොලිය තවදුරටත් ගෙවියයුතු ලෙස ගිණුම්වල දක්වා තිබුණි.

**2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මහවැලි උපදේශක සේවා කාර්යාංශ ( පුද්ගලික ) සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව කල්බදු සමාගම් දෙකක ණයහිමි වටිනාකම් පිළිවෙලින් රු.4,732,952 ක් හා රු.1,000,448 ක් වුවද ශේෂ සනාථ කිරීම් අනුව ඒවා පිළිවෙලින් රු.4,850,729 ක් හා රු.892,285 ක් විය.

(ආ) මහවැලි පශු සම්පත් සහ කෘෂි ව්‍යාපාර (පුද්ගලික) සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව ස්ථාවර වත්කම්වල වටිනාකම රු.88,183,837 ක් වුවද ලෙජර් ගිණුම් අනුව එම වටිනාකම රු.88,094,019 ක් වීමෙන් රු. 89,818 ක වෙනසක් විය.

**2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම**

පහත සඳහන් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

(අ) මහවැලි පශු සම්පත් සහ කෘෂි ව්‍යාපාර (පුද්ගලික) සමාගම

| විෂයය | වටිනාකම<br>රු | ඉදිරිපත් නොකළ සාක්ෂිය |
|---|---|---|
| මහවැලි ආර්ථික ඒජන්සිය | 405,218,731 | ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ගිණුම් ගත කර ඇති මෙම වටිනාකම් සනාථකර ගැනීමට හා ගිණුම් ගත කිරීමට අදාල ලියවිලි |
| කොත්මලේ කිරි සංවර්ධන අරමුදල | 2,900,000 | |
| යුරෝපා ආර්ථික කොමිසමේ ප්‍රාග්ධන ප්‍රදාන | 3,583,706 | |
| විදේශ ආධාර | 5,729,782 | |
| ස්ථාවර වත්කම් කපාහැරීම් | 859,256 | වටිනාකම සකස් වූ ආකාරය හා අදාල අනුමැතිය |
| ලැබියයුතු ගිණුම් - මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යාපාර (පුද්) සමාගම | 1,382,468 | ශේෂ සනාථ කිරීම් |

(ආ) ස්වාභාවික සම්පත් කළමනාකරණ සේවා ( පුද්ගලික ) සමාගම

| විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂිය |
|---|---|---|
| | රු. | |
| ලැබිය යුතු ආදායම් | 391,154 | ශේෂ සනාථ කිරීම් |
| ගෙවිය යුතු භාණ්ඩ හා සේවා බදු | 109,498 | බදු ගණනය කිරීමේ උපලේඛන |
| අස්පෘෂ්‍ය වත්කම් | 29,500 | වටිනාකම තහවුරු කරගැනීමට අදාල ලිඛිත සාක්ෂි |

## 2.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම - අධිකාරිය

### 2.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 47 ඡේදය ප්‍රකාරව සාධාරණ වටිනාකම සැලකියයුතු තරම් වෙනස්වන හා ඉක්මන් වෙනස්වීම් වලින් යුක්තවන වත්කම් ප්‍රත්‍යාගණනය කර සාධාරණ වටිනාකම් ගිණුම්ගත කළ යුතු වුවත් අධිකාරිය විසින් 1984 -1989 කාලයේදී මිලදී ගෙන තිබුණු පිරිවැය රු.67,440,853 ක් වූ ඉඩම් කට්ටි 03 ක සාධාරණ අගය ගිණුම්ගත කිරීමට කටයුතුකර නොතිබුණි.

### 2.3.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මහවැලි අධිකාරිය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති හා එහි පරිපාලිත සමාගම් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය කර තිබුණද ඒ පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් රු. 124,570,000 ක් වටිනා කෘෂි හා පශු සම්පත් තොගයේ වටිනාකම තීරණය කිරීමට යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිය හෙළිදරව්කර නොතිබුණි.

## 2.3.3 ගිණුම්කරණ අඩුපාඩු

---------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වික්ටෝරියා කලාපයේ පුස්තකාල පොත් 7,588 ක් පැවතුණද එය වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එල් කලාපය මිලදී ගෙන තිබුණු රු.985,960 ක පුස්තකාල පොත් වියදම් ලෙස ගිණුම්ගතකර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී කුඩා ජලවිදුලි බලාගාරවලින් නිෂ්පාදිත විදුලි බලය වෙනුවෙන් විදුලිබල මණ්ඩලයෙන් ලැබියයුතු රු.7,700,890 ක් ලැබියයුතු ආදායම් ලෙස ගිණුම් ගත කර නොතිබුණු අතර ඉකුත් වර්ෂය වෙනුවෙන් ලැබී තිබුණු රු.3,912,069 ක් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස දක්වා තිබුණි.

(ඇ) විගණනයේ ගණනය කිරීම් අනුව කලාප 06 ක හා ගොවිපලක ස්ථාවර වත්කම් ක්ෂය රු.4,003,885 ක් අඩුවෙන් ගිණුම්ගතකර තිබුණි.

(ඈ) වෙලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතියෙන් අධිකාරිය වෙත 2016 සැප්තැම්බර් 27 දින පවරන ලද රු.671,503,748 ක්වූ ස්ථාවර වත්කම්වල වටිනාකම ගිණුම්ගත කිරීමට හා හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) වැලිඔය කලාපය විසින් 2015 වර්ෂයේදී මිලදී ගන්නා ලද රු. 363,025 ක් වූ ගවයින්ගේ බර මිණුම්කරන තරාදිය එම වර්ෂයේ වියදම් ලෙස කපා හැර තිබීම නිසා ජංගම නොවන වත්කම් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) හුරුළුවැව කලාපයේ ජනපදිකයින්ට බෙදාදීම සඳහා 2016 වර්ෂයේදී මිලදී ගෙන තිබුණු රු.247,800 ක් වටිනා සෝජ් මහන මැෂින් 07 ක් තොග ලෙස ගිණුම්ගතකළ යුතු වුවත් ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කලාප දෙකක පැවති විවිධ පැලවර්ග 59,484 ක එකතු වටිනාකම හා එක් කලාපයක රු.352,620 ක් වටිනා විවිධ පැලවර්ග 8,765 ක් අවසාන තොගය ලෙස ගිණුම්ගතකර නොතිබුණි.

(ඌ) 2016 වර්ෂයේදී වික්ටෝරියා කලාපයට පවරාගත් වෝටර් ෆීල්ඩ් ආයතනයේ ගොඩනැගිලිවල වටිනාකම තක්සේරුකර ගිණුම්ගතකර නොතිබුණි.

(එ) "බී" කලාපය විසින් අරලගංවිල බීජ ගොවිපලේ එළුගාලක් හා මහවැලිතැන්න ඒකකයේ වී ගබඩාවක් ඉදිකිරීම සඳහා දරන ලද රු. 3,027,198 ක ප්‍රාග්ධන ස්වරූපයේ වියදම් පුනරාවර්තන වියදම් ලෙස දක්වා තිබුණි.

(ඒ) ඉකුත් වර්ෂ වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබුණු රු.20,960,226 ක හිඟ දේපල බදු ආදායම සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඔ) සුළු පරිමාණ ජල විදුලි බලාගාර 3 ක් ඉදිකිරීම සඳහා ආයෝජකයින්ට ලබා දී තිබුණු ඉඩම්වලින් අයවියයුතු රු.19,299,125 ක බදුකුලී ගිණුම්ගත කර නොතිබුණි.

**2.3.4 නොසැසැඳුණු පාලන ගිණුම්**

අධිකාරියේ කලාප අතර ස්ථාවර වත්කම් හුවමාරු කිරීමේදී අදාල කලාපවලට ස්ථාවර වත්කම් ලැබීම් හා නිකුත් කිරීම් ගිණුම් ඒකාබද්ධ කිරීමේදී තුලනය වියයුතු වුවද, කලාපවලින් ලැබුණු රු.136,709,000 ක් වටිනා වත්කම් හා කලාපවලට යවනලද රු.128,730,000 ක් වටිනා වත්කම් සම්බන්ධයෙන් ගිණුම් ඒකාබද්ධ කිරීමේදී රු.7,979,000 ක වෙනසක් නිරීක්ෂණය විය.

**2.3.5 අවිනිශ්චිත ගිණුම්**

අධිකාරියට අයත් පරිපාලිත සමාගමක මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් රු. 35,682,485 ක අවිනිශ්චිත ගිණුම් හදුනාගෙන නිරවුල් කිරීමකින් තොරව ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල ජංගම වත්කම් යටතේ ණයගැතියන් ලෙස දක්වා තිබුණි.

**2.3.6 විගණනය සඳහා සාක්ෂි නොවීම**

පහත සඳහන් ගිණුම් ශේෂ ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

| ගිණුම් විෂයය | | වටිනාකම රු. | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|---|
| ආයෝජන | - මහවැලි පශුසම්පත් හා කෘෂි ව්‍යාපාර (පුද්) සමාගම | 10,000,000 | ආයෝජන සහතික |
| | - මහවැලි වෙන්චර් කැපිටල් (පුද්) සමාගම | 9,800,000 | |
| | - මහවැලි උපදේශක කාර්යාංශ (පුද්) සමාගම | 64,000 | |
| | - ස්වාභාවික සම්පත් කළමනාකරණ (පුද්) සමාගම | 15,000 | |
| | - මහවැලි පශු සම්පත් ව්‍යාපාර සමාගම | 10,000,000 | |
| ඉතිරිකිරීමේ ගිණුම | | 2,632,908 | (i) ශේෂ සනාථ කිරීම්<br>(ii) බැංකු පාස් පොත |
| ස්ථාවර තැන්පතු | | 727,481 | (i) ශේෂ සනාථ කිරීම්<br>(ii) තැන්පතු සහතික |

## 2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට පැවති ලැබියයුතු බදුකුලී ආදායම වූ රු.662,953,920 ක් තුල වර්ෂ 05 ඉක්මවූ රු.140,623,878 ක් ද වර්ෂ 03 සිට වර්ෂ 05 ට අදාල රු.35,119,000 ක් ද විය. අධිකාරිය සතු ඉඩම් බදුදීම්වලින් බදු ආදායම් රැස්කිරීමට අදාලව පනවා තිබුණු නියමයන් හා කොන්දේසි නිසි පරිදි ක්‍රියාත්මක නොකිරීම, මෙසේ හිඟ බදු ආදායම් ශේෂය වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

(ආ) අධිකාරියට අයත් ගොඩනැගිලි බාහිර පාර්ශව වෙත කුලියට ලබාදීමේදී අදාල විදුලිය, ජලය හා පවිත්‍රතා වියදම් ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත ලබාදී තිබුණද 2016 දෙසැම්බර් 31 දින වන විට අධිකාරිය විසින් දරන ලද රු. 3,228,320 ක වියදම්, බාහිර පාර්ශව 06 කින් ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානය වන විට ගෙවිය යුතු ගිණුම්වල වටිනාකම රු.330,231,855 ක් වූ අතර, ඉන් රු. 12,082,658 ක් වසර 05 ඉක්මවා තිබුණි. එම ශේෂවල ඇතුළත් රු.5,053,925 ක රැඳවුම් මුදල්වලට අදාළ කොන්ත්‍රාත් වැඩවල සම්පූර්ණත්වය තහවුරුකර ගෙන රැඳවුම් මුදල් නිරවුල් කිරීමට කටයුතුකර නොතිබුණි.

(ඈ) 2010 වර්ෂයේදී අධිකාරිය සතු කලංකුට්ටිය ගොවිපලෙන් අක්කර 25ක භූමි ප්‍රමාණයක් වෙනත් අමාත්‍යාංශයකට අයත් පශු සම්පත් ව්‍යාපාරික සමාගමට විධිමත් පරිදි බදු දී නොතිබුණු අතර 2010 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා අයවිය යුතු බදු මුදල රු.5,985,000 ක් වී තිබුණි.

(ඉ) වික්ටෝරියා - කොත්මලේ කලාපයේ නිවාස වෙනුවෙන් අයවියයුතු බදු ආදායමින් රු.8,847,821 ක් මහවැලි සේවකයන්ගෙන් අයවියයුතු අතර බදුදී තිබුණු සිනමා ශාලාව සහිත ඉඩමෙන් 2016 දෙසැම්බර් 31 වන විට රු.1,507,427 ක බදු මුදලක් අයවිය යුතුව පැවතුණි. මෙම හිඟ බදු අයකිරීම සඳහා නඩු පවරා නොතිබුණි.

(ඊ) මාදුරුඔය 1 බලාගාරයේ විදුලි මීටරයේ දෝෂයක් හේතුවෙන් 2015 දෙසැම්බර් 12 සිට 2016 ජනවාරි 06 දක්වා කාලයට අඩුවෙන් ගණනයකර තිබූ කිලෝවොට් ප්‍රමාණය සඳහා රු. 4,128,992 ක් විදුලිබල මණ්ඩලයෙන් අයවියයුතුව තිබුණි.

(උ) මහවැලි උපදේශක සේවා කාර්යාංශ (පුද්) සමාගමේ, සමාලෝචිත වර්ෂය අවසානයට වර්ෂ 03 ක් ඉක්මවා තිබුණු රු.1,852,118 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂයන් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) 2010 වර්ෂයේදී වාරිමාර්ග හා ජල සම්පත් සංවර්ධන අමාත්‍යාංශයට පවරා තිබුණු මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යාපාර සමාගමේ නිරාවිය ගොවිපලේ පශු සම්පත් තොගය වෙනුවෙන් එම අමාත්‍යාංශයෙන් ලැබිය යුතු රු.5,820,430 ක් අයකර ගෙන නොතිබුණු අතර වසර 05 ක කාලයක් ඉක්මවූ රු.690,784 ක ණයහිමි ශේෂ නිරවුල් කර නොතිබුණි.

(එ) "බී" කලාපයේ ඉඩම්වලින් 2015 මැයි සිට 2016 දෙසැම්බර් 31 දින දක්වා ලබාගත් වැලි කියුබ් 75,941 ක් වෙනුවෙන් ලැබියයුතු ඉඩම් පරිහරන ගාස්තුව වූ රු.37,970,500 ක් තාක්ෂණික සේවා පුද්ගලික සමාගමෙන් අයකරගැනීමට කටයුතුකර නොතිබුණි.

## 2.5 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1979 අංක 23 දරන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනත | |
| (i) 39 (1) වගන්තිය | පරිපාලිත සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩලය, ආණ්ඩුවේ අධ්‍යක්ෂවරුන් සහ කොටස්කාර අධ්‍යක්ෂවරුන් 07 දෙනෙකුගෙන් සමන්විත විය යුතු වුවත් එම සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩලය තිදෙනෙකුගෙන් පමණක් සමන්විත වී තිබුණි. |
| (ii) 42 (1) වගන්තිය | පරිපාලිත සමාගම්වල කොටස් ප්‍රාග්ධනය රු.100 සාමාන්‍ය කොටස්වලින් සමන්විත වියයුතු වුවද ස්වාභාවික සම්පත් කළමනාකරණ සේවා (පුද්) සමාගමේ අනුදත් ප්‍රාග්ධනය රු.10 සාමාන්‍ය කොටස් 10,000,000 කින් හා මහවැලි පශු සම්පත් සහ කෘෂි ව්‍යාපාර (පුද්ගලික) සමාගමේ ප්‍රාග්ධනය රු.10 සාමාන්‍ය කොටස් 5,000,000 කින් සමන්විත වී තිබුණි. |
| (iii) 45(1) වන වගන්තිය | සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, එම අධ්‍යක්ෂවරුන් අතරින් එක් අධ්‍යක්ෂවරයෙක් සමාගමේ සභාපති ලෙස තෝරා පත්කර ගතයුතු වුවද, සමාගම් දෙකක රේඛීය අමාත්‍යවරයා හා අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අධ්‍යක්ෂවරයෙකු සභාපති ලෙස පත්කර තිබුණු අතර එක් සමාගමක 2015 සැප්තැම්බර් සිට සභාපතිවරයෙකු පත්කර නොතිබුණි. |

| | |
|---|---|
| (ආ) 2013 අංක 17 දරන එකතු කල අගය මත බදු (සංශෝධිත) පනතේ 10 (ආ) වගන්තිය | සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේදී මාස 12 ක කාලසීමාව සඳහා භාණ්ඩ හා සේවා සැපයුම් හෝ භාණ්ඩ හා සේවා සැපයුම් වල මුළු වටිනාකම රු.මිලියන 12 ඉක්මවන්නේ නම් පනත යටතේ එකතුකල අගය මත බදු සඳහා ලියාපදිංචි වියයුතු නමුත් අධිකාරිය විසින් අදාල ආදායම් ප්‍රභවයන්ගෙන් ඉකුත් වර්ෂයේදී රු.මිලියන 18 ක් හා සමාලෝචිත වර්ෂයේ රු. මිලියන 87 ක ආදායමක් රැස්කර තිබුණද එකතු කල අගය මත බදු සඳහා ලියාපදිංචිවීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 104(4) | බාහිර පාර්ශව දෙකකට මුදාහැර තිබුණු වාහන දෙකක් අනතුරුවලට ලක්වී තිබුණද මුදල් රෙගුලාසි ප්‍රකාරව විධිමත් පරීක්ෂණයක් සිදුකර නොතිබුණු අතර අලාභ තක්සේරුකර වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකරගැනීමට කටයුතුකර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 756 | හුරුළු වැව කලාපයේ සමාලෝචිත වර්ෂයේ සිදුකළ වත්කම් සමීක්ෂණයේදී හඳුනාගන්නා ලද අතිරික්තතා 292 ක් හා ඌනතා 50 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතුකර නොතිබුණි. |
| (ඈ) 2016 ජනවාරි 01 දිනැති අංක 01/2016 දරන විගණන හා කළමනාකරණ දෙපාර්තමේන්තු චක්‍රලේඛය | චක්‍රලේඛය ප්‍රකාරව ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් වාහන සම්බන්ධයෙන් පරිගණකගත තොරතුරු පද්ධතියක් පවත්වාගෙන ගොස් නොතිබුණු බැවින් අධිකාරිය සතු වාහන සංඛ්‍යාව, එම වාහනවල ලියාපදිංචි අයිතිය, වාහන අනුයුක්තකර ඇති අංශය සහ එහි රියදුරු වැනි තොරතුරු මෙන්ම අධිකාරියට අයිති වාහන කොපමණ ප්‍රමාණයක් පවතීද යන්න පිළිබඳ නිවැරදි තොරතුරක් ලබාගැනීමට අපහසු විය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | අධිකාරියේ මූල්‍ය කාර්ය පරිපාටි සංග්‍රහයේ 1.5.1 ඡේදය හා අධ්‍යක්ෂ ජනරාල්ගේ 2012 මාර්තු 15 දිනැති අංක 02/2012 දරන අභ්‍යන්තර චක්‍රලේඛයේ 05 වන වගන්තිය | (i) | අත්තිකාරම් ලබාගත් කාර්යය අවසන් වී දින 07 ක් ඇතුළත අත්තිකාරම් පියවියයුතු වුවද "එල්" කලාපයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් වර්ෂ එකකට වඩා වැඩි නොපියවූ අත්තිකාරම් වටිනාකම රු. 11,881,612 ක් විය. |
| | | (ii) | ලබාගත් අත්තිකාරම් පියවීමකින් තොරව නැවත අත්තිකාරම් ලබාගත නොහැකි වුවද ඊට පටහැනිව කලාප 6 ක් විසින් අවස්ථා 61 කදී රු.1,137,401 ක් ඉන්ධන හා මිලදී ගැනීමේ අත්තිකාරම් වශයෙන් ලබාදී තිබුණි. එම අත්තිකාරම් වර්ෂය අවසානය වන විටද පියවා නොතිබුණි. |
| (ඊ) | 2011 පෙබරවාරි 11 දිනැති අංක 57 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය හා 2015 මාර්තු 31 දිනැති අංක 2/2015 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 08 ඡේදය | | මහවැලි උපදේශක සේවා කාර්යාංශ (පුද්) සමාගම විසින් සමාලෝචිත වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව ත්‍යාග සඳහා රු.539,000 ක් වියදම් කර තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේදී සමූහයේ හා අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵල පිළිවෙලින් රු.34,602,000 ක හා රු.37,853,000 ක ඌනතාවයන් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවයන් රු.271,246,000 ක් හා රු.273,450,000 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි පිළිවෙලින් රු.236,644,000 ක හා රු.235,597,000 ක ඌනතාවයන්ගේ අඩුවීමක් පෙන්නුම් කෙරුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ රු.350,271,000 ක්ව පැවති ඌනතාවය උච්ඡාවචනය වෙමින් 2016 වර්ෂයේදී රු. 37,853,000 ක් වී තිබුණි. මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය හා බදු නැවත ගැලපීමේදී 2012 වර්ෂයේ රු.1,876,561,000 ක්ව පැවති අධිකාරියේ දායකත්වය 2013 හා 2014 වර්ෂ වලදී අඛණ්ඩව වැඩිවී 2015 වර්ෂයේදී රු.3,081,393,000 ක් වී තිබුණද සමාලෝචිත වර්ෂයේදී රු.2,520,568,000 ක් ලෙස අඩු වී තිබුණි.

**3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී ගොවිපල නිෂ්පාදන විකුණුම්වලින් ලැබුණු ආදායම රු.81,911,000 කින් වැඩිවී තිබුණි. මොරගහකන්ද ව්‍යාපෘතියට අයත්ව තිබුණු නිරාවිය ගොවිපල සමාලෝචිත වර්ෂයේදී අධිකාරියට පැවරීම මෙයට හේතුවී තිබුණි.

(ආ) ජනපදිකයින් පුනරුත්ථාපනය, වර්ධනය හා නඩත්තු වියදම් 2015 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුලදී රු.763,401,000 කින් වැඩිවී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී "බී" කලාපයේ ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම මෙයට හේතු වී තිබුණි.

**3.3 අධිකාරියට එරෙහිව හෝ අධිකාරිය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි**

ප්‍රධාන කාර්යාලය , කලාප 07 ක්, අංශ දෙකක් හා ව්‍යාපෘතියක් විසින් විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව බාහිර ආයතන හා පුද්ගලයන් විසින් නිවාස සන්තකය ආපසු ලබාගැනීම සඳහා අධිකාරියට එරෙහිව නඩු 161 ක් ගොනු කර තිබුණි. එහි මූල්‍ය බැඳීම රු.මිලියන 8.491 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල එය රු.මිලියන 25.395 ක් ලෙස වැඩියෙන් දක්වා තිබුණි. තවද අධිකාරිය විසින් නිවාස හා ඉඩම් සන්තකය ලබාගැනීම හා වෙනත් හේතූන් මත රු.10,230,554 ක වන්දි ඉල්ලුම්කර බාහිර ආයතන හා පුද්ගලයන්ට එරෙහිව අධිකරණවල නඩු 60 ක් ගොනුකර තිබුණද ඒ බව මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මහවැලි මහ සැලැස්ම

මහවැලි මහ සැලැස්මට අනුව මහවැලි ගඟේ ඝන මීටර් මිලියන 6,900 ක පමණ වූ ජල ප්‍රමාණයෙන් විදුලි බල නිෂ්පාදනයට හා මහවැලි කලාප 13 ක ඉඩම් හෙක්ටයාර් 365,853 ක් සඳහා වාරි පහසුකම් සැපයීමට යෝජිතව තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට ඉඩම් හෙක්ටයාර 85,252 ක් සඳහා පමණක් වාරි පහසුකම් සපයා තිබුණු අතර විදුලි බලය නිෂ්පාදනය සඳහා යෙදවීමට යෝජිත ජලාශ 11 න් ජලාශ 06 ක් පමණක් උපයෝජනය කරගනිමින් ජල විදුලිය නිෂ්පාදනය කර තිබුණි.

1968 වර්ෂයේදී සකස් කර ඇති මහවැලි මහ සැලැස්ම වර්තමාන අවශ්‍යතාවයන්, ස්වාභාවික සම්පත්වල ස්වභාවය හා භාවිතය සැලකිල්ලට ගෙන යාවත්කාලීන සැලැස්මක් ලෙස සකස් කිරීම වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතියේ එක් කාර්යයක් වූ අතර, එම සැලසුම් 2013 වර්ෂයේදී සකස් කර අවසන් කර තිබුණි. එහෙත් එම සැලැස්ම සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) ඉඩම් අංශයේ ක්‍රියාකාරී සැලැස්ම හා කාර්යසාධන වාර්තා අනුව සමාලෝචිත වර්ෂයේ දී වාණිජ හා ආයෝජන ව්‍යාපෘති සඳහා ඉඩම් කට්ටි 665 ක් බෙදා දීමට සැලසුම්කර තිබුණද ඉඩම් කට්ටි 91 ක් පමණක් බෙදා දී තිබුණි. තවද ඉඩම් කට්ටි 635 ක් සඳහා ප්‍රදානපත්‍ර/දීමනාපත්‍ර/ දීර්ඝකාලීන බදු බලපත්‍ර බෙදාදීමට සැලසුම්කර තිබුණද ඉඩම් කට්ටි 227 ක් සඳහා පමණක් එම බලපත්‍ර ලබාදී තිබුණි.

(ඇ) ජනපදිකයින් සඳහා ණය යෝජනා ක්‍රමයන් ක්‍රියාත්මක කිරීමේ අරමුණින් 2002 වර්ෂයේ චක්‍රීය අරමුදලක් ඇති කිරීමට අධිකාරිය විසින් ඌව සංවර්ධන හා රජරට සංවර්ධන බැංකුවේ රු. 48,000,000 ක් ආයෝජනය කර තිබුණද බැංකු සමඟ ඇති කරගෙන තිබුණු ගිවිසුම් කොන්දේසි ක්‍රියාත්මක නොවීම නිසා උක්ත අරමුණු ඉටුවී නොතිබුණි.

(ඈ) මහවැලි උපදේශක සේවා කාර්යාංශ ( පුද්) සමාගමේ සාංගමික සංස්ථා පත්‍රයට අනුව ලංකාව තුළ සහ ඉන් පිටත ඉඩම් සහ ජල සම්පත් සංවර්ධන ව්‍යාපෘතිවලට අදාලව ශක්‍යතා අධ්‍යයනයන් සිදුකිරීම, ඉඩම් පරිහරණ සහ ජල සම්පත් ව්‍යාපෘති සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම, සමාජ ආර්ථික යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කිරීම, නිර්මාණය කිරීම හා ක්‍රියාත්මක කිරීම, පාරිසරික ඉදිකිරීම් ව්‍යාපෘති සමීක්ෂණ කිරීම, සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම , පරිසර දූෂණය පාලනය කිරීමේ ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම යන අරමුණු ක්‍රියාත්මක කර නොතිබුණි. තවද ක්‍රියාකාරී සැලැස්මට අනුව අදාල අංශවල අපේක්ෂිත ඉලක්කයන් දක්වා නොතිබීම හා කාර්යසාධන වාර්තා ක්‍රියාකාරී සැලැස්මට අනුව සකස්කර නොතිබීම හේතුවෙන් සැලසුම්කළ පරිදි එක් එක් අංශවල කාර්යසාධනය ළඟාකරගෙන ඇත්දැයි පරීක්ෂාකළ නොහැකි විය.

(ඉ) මහවැලි පශු සම්පත් සහ කෘෂි ව්‍යාපාර (පුද්) සමාගමේ සාංගමික සංස්ථා පත්‍රයට අනුව ගොවිපලවල වගා කටයුතු සිදුකිරීම, තොග සහ සිල්ලර වශයෙන් කුකුල් පාලනය සිදුකිරීම, ගොවීන්ට කුකුල් පාලනය සඳහා අවශ්‍ය කෑම නිෂ්පාදනය, ගව, ඌරන්, කුකුලන් ආදී සතුන් බෝ කිරීම, විකිණීම, වැඩිදියුණු කිරීම, සැකසීම හා අපනයන කටයුතු හා පලතුරු, ධාන්‍ය වර්ග ආශ්‍රිත ව්‍යාපාරික කටයුතු සිදුකිරීම යන අරමුණු ඉටුකර නොතිබුණු අතර මීගව, එළගව, කුකුල්, ඌරන් හා එළු පාලනය සුළු වශයෙන් සහ කිරි ආශ්‍රිත නිෂ්පාදන කිරීමේ කටයුතු පමණක් සිදුකරමින් පැවතුණි.

(ඊ) ස්වාභාවික සම්පත් කළමනාකරණ සේවා ( පුද් ) සමාගමේ සාංගමික සංස්ථා පත්‍රය අනුව ශ්‍රී ලංකාවේ සහ ඉන් පිටත සිදුකරන භූමි සමීක්ෂණ, ගුවන් ඡායාරූපකරණය, චන්ද්‍රිකා ඡායාරූපකරණය , භූගෝලීය තොරතුරු පද්ධතිය, ගෝලීය පිහිටීම් පද්ධති මඟින් පස්, භූමි ආකෘති භූ ලක්ෂණ, ඉඩම් භාවිතය, වෘක්ෂලතා, ජෛව විවිධත්වය, ජලයේ ගුණත්වය ආදී පාරිසරික පරාමිතීන් සිතියම්ගත කිරීම, විශ්ලේෂණය කිරීම , භූ සම්පත් තක්සේරුව, භූ පරිහරණ සැලසුම්, පාංශු ඛාදනය හා පාංශු රක්ෂණය, ආරක්ෂිත ප්‍රදේශ කළමනාකරණය, ශාඛ ඖෂධ වගාව හා තිරසාර කාබනික වගා පද්ධති සඳහා උපදෙස්දීම, සැලසුම් සකස්කිරීම සහ පුහුණු කිරීම කළ යුතු වුවද පාරිසරික වාර්තා ලබාදීම පමණක් සමාගමේ ප්‍රධාන කාර්යයක් වී තිබුණි. තාක්ෂණික දැනුම සහිත කාර්ය මණ්ඩලයක් සමාගම සතු නොවූ බැවින් බාහිර පාර්ශවයකින් පාරිසරික වාර්තා සකස් කර ලබාගන්නා අතර එම වාර්තාවල නිවැරදිභාවය සහතික කිරීමේ හැකියාවක් ද සමාගම සතු නොවීය.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මහවැලි “ එච් ” කලාපයට අවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීමේදී සැපයුම්කරුවන්ගේ ලිඛිත ඉල්ලීමක් හෝ ගිවිසුමක් නොමැතිව ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය හා ගැණුම් ඇණවුම මත සැපයුම් අත්තිකාරම් ලෙස සැපයුම්කරුවන් නමට ලියන ලද රු. 5,123,027 ක් වටිනා චෙක්පත් 28 ක් අධිකාරියේ එක් එක් අංශවල නිළධාරීන් වෙත නිකුත් කර තිබුණි. අදාල කාර්යය ඉටුනොවීම මත එම චෙක්පත් මාස 03 කට පසුව අවලංගු කර තිබුණි.

(ආ) පිරිවැය රු.42,520,000 ක් වූ ඉඩම් කට්ටි 02 ක් ගාස්තු ගෙවීමෙන් තොරව බාහිර පාර්ශවයන් විසින් භාවිතයට ගනිමින් පැවතුණද එම ඉඩම් අත්පත්කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) කොත්මලේ භූගෝලීය තොරතුරු පද්ධති අංශය විසින් වර්ග කි.මී 3,118 ක් පමණ වන ඉහළ මහවැලි ජලාධාර කලාපයේ භූගෝලීය තොරතුරු දත්ත ගබඩාවක් පිළියෙල කිරීම සහ යාවත්කාලීන කිරීම, චන්ද්‍රිකා ඡායාරූප මඟින් මහවැලි කලාපවල ඉඩම් පරිහරණ රටාවන් පිළිබඳ සිතියම් සකස්කිරීම සහ යාවත්කාලීන කිරීම, ඉහළ මහවැලි ජලාධාර ප්‍රදේශයේ ඉඩම් පරිහරණ රටාවන්වල වෙනස්කම් පාලනය කිරීම, නැවත වන වගාවන් සඳහා සුදුසු ඉඩම් සහ පාංශු සංරක්ෂණය කළ යුතු ප්‍රදේශ හඳුනාගැනීම, වර්ෂාපතන තොරතුරු අනුව සිතියම් සකස්කිරීම සහ යාවත්කාලීන කිරීම, භූගෝලීය තොරතුරු පද්ධතිය සහ චන්ද්‍රිකා ඡායාරූප මඟින් ඉඩම් පරිහරණ කටයුතු සැලසුම් කිරීම සහ ජලාධාර කළමනාකරණ කටයුතු සිදු කිරීම යන කාර්යයන් සඳහා 2006 වර්ෂයේදී නිලධාරීන් 11 දෙනෙකු රාජකාරි ඉටුකරමින් පැවතියද 2006 වර්ෂයෙන් පසුව එක් නිලධාරියෙකු පමණක් සේවයේ යොදවා තිබුණි. එබැවින් වර්තමානයේ අදාල කාර්යයන් ඉටුනොවීම මත ඉහළ මහවැලි ජලාධාර කලාපයේ ඇතුළු මහවැලි කලාපවල පරිසර හා වන සංරක්ෂණ කටයුතු කළමනාකරණය කිරීම ක්‍රමවත්ව සිදු කිරීමට තිබුණු අවස්ථාව අහිමි වී තිබුණි. ඒ අනුව අවශ්‍ය නිලධාරීන් වැඩිකර ඉහළ කාර්යය සාධනයක් ළඟාකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයට අදාල වාර්ෂික භෞතික තොග සත්‍යාපන කමිටුවේ නිර්දේශ අනුව වික්ටෝරියා කලාපයේ ප්‍රයෝජනයට ගත නොහැකි ලී බඩු, කාර්යාල උපකරණ හා පිරියත අයිතමයන් 126 ක් අපහරණය කිරීමට 2016 අගෝස්තු 18 දින නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා මුදල්) විසින් අනුමැතිය ලබාදී තිබුණද 2017 දෙසැම්බර් 31 දින වනවිටද ඒ සඳහා අවශ්‍ය පියවර නොගෙන වරාපිටිය ගබඩා පරිශ්‍රයේ තබා තිබුණි.

(ඉ) වික්ටෝරියා කලාපයට අයිති වරාපිටියේ පිහිටි ගබඩා 3 ක් සහ නේවාසික කාමරයකින් සමන්විත වූ ගබඩා පරිශ්‍රයෙන් ගබඩා 2 ක් හා නේවාසික කාමරය සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ වෛද්‍ය සැපයුම් අංශය විසින් භාවිතා කරමින් පැවතුණද ඒවා නීත්‍යානුකූලව එම අංශයට භාරදී නොතිබුණි. තවද එම පරිශ්‍රයේ පවතින අනෙක් ගොඩනැගිල්ල දීර්ඝ කාලයක සිට අළුත්වැඩියා නොකිරීම හේතුවෙන් විනාශ වෙමින් පැවතුණි.

(ඊ) අධිකාරිය විසින් සමාගම් 05 ක සිදුකර තිබුණු රු. 439,000,000 ක ආයෝජන සඳහා වසර ගණනාවක් සිට කිසිදු ප්‍රතිලාභයක් ලැබී නොතිබුණි.

(උ) කොත්මලේ පටක රෝපණ අංශය විසින් පසුගිය වර්ෂ පහ තුල උණ පැළ 734,458 ක් නිෂ්පාදනයකර පැළ 515,837 ක් අදාල ක්ෂේත්‍රය වෙත නිකුත් කර තිබුණි. එම පැළ සිටුවීම, නඩත්තුව, රැකබලාගැනීම සහ වර්ධනය පිළිබඳ පසු විපරම් සිදුකර නොතිබුණි.

(ඌ) 1979 අංක 23 දරන ශ්‍රී ලංකා මහවැලි අධිකාරි පනතේ 13(13) වගන්තිය ප්‍රකාරව අධිකාරිය විසින් සපයනු ලබන ජලය සඳහා හෝ සලසනු ලබන යම් සේවාවක් සඳහා අයකිරීමක් හෝ ගාස්තුවක් පැනවිය හැකි බව නිශ්චය කර තිබුණි. මහවැලි ජලය භාවිතා කරන බාහිර පාර්ශවයන්ගෙන් ගාස්තුවක් අයකරනු ලැබුවද මහවැලි ජලාශවලින් විදුලිය නිපදවීම සඳහා 1985 වර්ෂයේ සිට 2016 දෙසැම්බර් 31 දක්වා ජල කියුබික් මීටර් මිලියන 211,391.93 ක් විදුලිබල මණ්ඩලය විසින් භාවිතයට ගෙන තිබුණද ඒ සඳහා ගාස්තුවක් අයකර ගෙන නොතිබුණි. එසේ වුවද එම ජලාශ හා වේලි නඩත්තු සහ මෙහෙයවීම් වෙනුවෙන් වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම් ව්‍යාපෘතිය හා මහවැලි අධිකාරිය විසින් ආරම්භයේ සිට 2016 දෙසැම්බර් 31 දින දක්වා රු. මිලියන 8,210 ක් වැයකර තිබුණි.

(එ) කොත්මලේ, වික්ටෝරියා හා රන්දෙණිගල යන ඉහළ මහවැලි ජලාධාර ප්‍රදේශයේ මහවැලි ගඟේ ප්‍රධාන අතු ගංගාවල ජලය සහ රක්ෂිත ඉඩම් භාවිතාකරමින් ක්‍රියාත්මක වන සුළු පරිමාණ ජල විදුලි බලාගාර 46 ක් හා ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලැබී තිබුණු ජලවිදුලි බලාගාර 24 ක් පැවතියද ඒවායින් 1979 අංක 23 දරන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනතේ 3(1),12 සහ 13 වගන්ති ප්‍රකාරව රාජ්‍ය භාගය අයකර ගැනීමට සුදුසු වැඩපිළිවෙලක් සකස්කර නොතිබුණි.

(ඒ) අධිකාරිය සතු නොවූ ජාවත්ත ප්‍රදේශයේ පිහිටි ඉඩම්වල අධිකාරිය විසින් රු.76,580,000 ක් වටිනා ගොඩනැගිලි ඉදිකර තිබුණු අතර එම ඉඩම්වල අයිතිය අධිකාරිය වෙත පවරා ගැනීමට 2016 දෙසැම්බර් 31 දින වනවිටත් කටයුතුකර නොතිබුණි.

(ඔ) නඩත්තු වියදම අධිකවීම හා සතුන්ගෙන් ලැබෙන ආදායම අඩුවීම නිසා සමාලෝචිත වර්ෂයේදී එච් කලාපයේ නිරාවිය ගොවිපලට අයත්ව තිබුණු රු.7,347,608 ක් වටිනා සතුන් 383 දෙනෙක් ජාතික පශු සම්පත් හා සංවර්ධන මණ්ඩලය වෙත භාරදී තිබුණි. සතුන්ගේ වටිනාකම අයකර ගැනීම සඳහා දෙපාර්ශවය විසින් එකඟතාවයකට එළඹ නොතිබීම හේතුවෙන් පශු සම්පත් තොගයේ වටිනාකම අයකර ගැනීමට නොහැකිවී තිබුණු අතර, අයවියයුතු මුදලක් ලෙස හෝ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඕ) (i) මහවැලි උපදේශක සේවා කාර්යාංශ ( පුද්ගලික ) සමාගම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

- 2016 මාර්තු 24 දිනැති අංක 16/0416/704/012 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් මොරගහකන්ද ජලාශයේ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවට අදාල සැලසුම් ඇගයීම් කර අනුමත කිරීම සහ ඉදිකිරීම් වැඩ අධීක්ෂණය සඳහා වූ වර්ෂයක උපදේශක කොන්ත්‍රාත්තුව රු. 167,174,700 ක මුදලකට ( බදු රහිත ) 2016 මාර්තු 15 දින සිට සමාගම වෙත ලබා දී තිබුණි. සමාගම විසින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනයකර උපදේශකවරුන් තෝරා ගැනීම වෙනුවට මොරගහකන්ද ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් නම්කර තිබූ නිලධාරීන් පස් දෙනෙකු දේශීය උපදේශකයින් ලෙස පත්කර උපදේශන හා අධීක්ෂණ කටයුතු ඔවුන් වෙත පවරා තිබුණි. සමාගම විසින් ඊට අදාල බිල්පත් සකස් කිරීමේ කටයුතු පමණක් සිදු කර තිබුණි. තවද කොන්ත්‍රාත්තුවට අදාලව විදේශීය උපදේශකයින් සේවයේ යෙදවීම සඳහා පෞද්ගලික උපදේශක ඉංජිනේරු සමාගමකට උප කොන්ත්‍රාත්තුවක් ලබා දී තිබුණි.

- 2011 වර්ෂයේදී සමාගමට එරෙහිව බාහිර පාර්ශවයක් විසින් වන්දි ඉල්ලා පවරා තිබූ නඩුව වෙනුවෙන් සමාගම පෙනී නොසිටීම හේතුවෙන් 2013 වර්ෂයේ අධිකරණ නියෝගය පරිදි රු.මිලියන 4.5 ක වන්දියක් ගෙවීමට සිදුවී තිබුණි. මේ සඳහා 2013, 2014 සහ 2015 වර්ෂවල මූල්‍ය ප්‍රකාශනවල ගෙවියයුතු වන්දි වෙනුවෙන් කිසිදු ප්‍රතිපාදනයක් සිදු කර නොතිබුණු අතර 2016 වර්ෂයේදී රු.2,000,000 ක් ප්‍රතිපාදනය කර 2017 වර්ෂයේදී එම මුදල ගෙවා තිබුණි. මෙම නඩුව සම්බන්ධයෙන් සමාගම් ලේකම්වරිය විසින් සිය රාජකාරී වගකීම් නිසි පරිදි ඉටුකර නොතිබියදී ඒ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් නොපවත්වා සේවයෙන් ඉවත්වීමට ඉඩ දී තිබුණු අතර අනුමැතියකින් තොරව බඳවාගෙන තිබුණු ඉහත නඩුවට සම්බන්ධ රියදුරුද අනතුර සම්බන්ධයෙන් පරීක්ෂණයක් නොපවත්වා සේවයෙන් ඉවත්කර තිබුණි.

(ii) මහවැලි පශු සම්පත් සහ කෘෂි ව්‍යාපාර (පුද්ගලික) සමාගම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

- ගිරාදුරුකෝට්ටෙ ගොවිපල තුළ 1986 වර්ෂයේ දී ආරම්භකරන ලද කිරි සැකසුම්හලෙහි ආරම්භයේ සිට භාවිතා කරන ලද යන්ත්‍ර සූත්‍ර පැවතීම, කර්මාන්තශාලා ගොඩනැගිලි පැරණිවීම , වහලය අබලන්වීම හා වැසි ජලය කර්මාන්තශාලාව තුළට පැමිණීම, කානු පද්ධතිය අබලන්වීම, අභ්‍යන්තර පිරිසිදු කිරීම් පද්ධතිය දුර්වලව පැවතීම නිසා සෞඛ්‍යාරක්ෂිත ගැටළු පැනනැගීම හේතුවෙන් නිෂ්පාදන කටයුතු සිදුකිරීමට අපහසු වී තිබුණි. තවද දුර්වල පරිසර තත්ත්වයන් මත නිෂ්පාදන කාර්යයන් සිදුකිරීම නිසා ඉදිරියේදී නීතිමය ගැටළු පැනනැගීමට හැකියාව පැවතියද ඒ සම්බන්ධයෙන් කළමනාකරණය විසින් සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

- 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා සේවක අර්ථසාධක අරමුදලට රු.8,237,607 ක් හා සේවක භාරකාර අරමුදලට රු. 334,846 ක දායක මුදලක් ගෙවිය යුතුව පැවතීම නිසා ඉදිරියේදී සමාගමට අධිභාර ගෙවීමට සිදුවිය හැකි බව නිරීක්ෂණය විය.

- මූල්‍ය ප්‍රකාශනවල ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණු රු.14,929,159 ක් වටිනා ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතුකර නොතිබුණි.

- සමාගමේ අනුදත් ප්‍රාග්ධනය වූ රු.10 කොටස් 5,000,000 න් කොටස් 03 ක් ප්‍රාරම්භක අධ්‍යක්ෂවරුන් වන වෙනත් පුද්ගලික සමාගමක අධ්‍යක්ෂවරුන් තිදෙනෙකු වෙත නිකුත්කර තිබුණද ඉතිරි කොටස් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම නිකුත්කර නොතිබුණි. මහවැලි අධිකාරිය සඳහා සමාගමේ කිසිදු කොටසක් ලබාදී නොතිබුණු නිසා සමාගම සම්බන්ධයෙන් අධිකාරියේ හිමිකාරිත්වය පිළිබඳ ගැටළු සහගත තත්ත්වයක් නිරීක්ෂණය විය.

(iii) ස්වභාවික සම්පත් කළමනාකරණ සේවා (පුද්ගලික) සමාගම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සමාගම විසින් මහවැලි අධිකාරියට අයත් දිගන පිහිටි ගොඩනැගිල්ලක තම කාර්යාලය පවත්වාගෙන යන අතර ඒ සඳහා ගිවිසුමක් නොවීය. එසේම අධිකාරිය වෙත මාසික බදු කුලී ගෙවීම සඳහා නිශ්චිත පදනමක් ද නොවූ අතර 2015 දෙසැම්බර් 31 දිනට ඊට අදාල ගෙවියයුතු කුලිය රු.600,000 ක් සමාගම විසින් ගිණුම්ගත කර තිබුණි. පසුව එම ගෙවියයුතු මුදල කිසිදු අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේදී කපාහැර වෙනත් ආදායම් ලෙස ගිණුම් ගත කර තිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරියේ නිරාවිය ගොවිපලට අයත් අක්කර 26 ක් පමණ ඉඩම අනුරාධපුර ඉඩම් ලියාපදංචි කිරීමේ කාර්යාලය විසින් 1989 ඔක්තෝබර් 26 දිනැති අංක 2060 හා එල්/4/තඹු/6/102 දරන දීර්ඝකාලීන බදුකරය මඟින් තිස් අවුරුදු කාලයකට පශු සම්පත් ව්‍යාපාරික සමාගම වෙත බදුදී තිබුණි. බාහිර පාර්ශවයක් විසින් සිදුකර තිබුණු මෙම බදුදීම නිවැරදිකර අධිකාරියට බදු අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි. එසේම ජේබිය අමාත්‍යංශ ලේකම්ගේ 2010 සැප්තැම්බර් 20 දිනැති ලිපිය අනුව නිරාවිය ගොවිපල සතු කුකුල් කූඩු 07 ක් උක්ත සමාගමට බදු දී තිබුණද ඊට අදාල බදු මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) අධිකාරියට අයත් රු.104,394,675 ක් වටිනා ගොඩනැගිලි ගිවිසුම්ගතවීමකින් තොරව රාජ්‍ය ආයතන 13 ක් විසින් භාවිතයට ගන්නා නමුත් ඒ සඳහා කුලියක් අයකර ගැනීමට 2016 දෙසැම්බර් 31 දින වනවිටත් අධිකාරිය පියවර ගෙන නොතිබුණි. එසේම මහවැලි ආරක්ෂක බළකාය සතු රු.26,030,780 ක් වටිනා ගොඩනැගිල්ලක්, පුහුණු ශාලා 03 ක්, හා නිල නිවාස 24 ක් ගිවිසුමකින් තොරව 2012 දෙසැම්බර් 24 දින සිට තාවකාලික පදනමින් කොත්මලේ ජාත්‍යන්තර පුහුණු ආයතනයට භාරදී තිබුණද බාරදුන් දින සිට එමඟින් කුලී ආදායමක් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සන්නිවේදන කුළුණු 10 ක් ස්ථාපිත කිරීම සඳහා මාධ්‍ය ආයතන වෙත එච් කලාපයේ අධිකාරිය සතු ඉඩම් ලබාදීමේදී අදාල බදුකරුවන් සමඟ ගිවිසුම්වලට එළඹ නොතිබුණු අතර ඉඩම් 05 ක වෙළඳපල අගය රජයේ තක්සේරුකරුගෙන් ලබානොගෙන අධිකාරියේ දළ තක්සේරුව මත වාර්ෂික බදු කුලී තීරණය කර තිබුණි.

(ඈ) ඉහළ මහවැලි ජලාධාර ප්‍රදේශයේ කුඩා ජල පෝෂක ප්‍රදේශ 7 ක රු. 2,277,100 ක් වියදම් කර ස්ථාපිත කර තිබුණු ස්වයංක්‍රීය ජල මිනුම් දත්ත රැස්කිරීමේ උපකරණ පද්ධතිය මඟින් මහවැලි ගඟ සහ එහි අතු ගංගාවල ජලමට්ටම් තොරතුරු ඉතා ඉක්මනින් සහ පහසුවෙන් ලබා ගත හැකි වී තිබුණු නමුත් මෙම දත්ත විශ්ලේෂණය කර අවශ්‍යතාවයන් අනුව කාලීනව වාර්තාකිරීමට ක්‍රමවේදයක් ස්ථාපිත කර නොතිබුණි.

(ඉ) වැලිඔය කලාපයේ වාහන 12 ක් වර්ෂ 01 ත් වර්ෂ 10 ත් අතර කාලයක් අලුත්වැඩියා නොකර තබා තිබීම නිසා එම වාහන අලුත්වැඩියා කළ නොහැකි තත්ත්වයට පත්වී තිබුණු අතර වාහන අපහරණය කිරීමට හෝ වෙනත් ක්‍රියාමාර්ගයක් ගැනීමට හෝ කටයුතුකර නොතිබුණි.

(ඊ) එච්, ඩී හා බී කලාපවල ආයෝජකයින්ට ව්‍යාපෘති ආරම්භ කිරීම සඳහා අධිකාරිය විසින් ලබාදුන් ඉඩම් අක්කර 4342.51 කින් ව්‍යාපෘති ආරම්භ කරන ලද ඉඩම් ප්‍රමාණය අක්කර 2744.32 ක් පමණක් විය. ඒ අනුව ඉතිරි ඉඩම් අක්කර 1598.19 හි ගිවිසුම් ප්‍රකාරව ව්‍යාපෘති ආරම්භ නොකිරීමට හේතු සොයා බලා අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) වගා කටයුතු සඳහා එල්" කලාපයේ අක්කර 755 ක් වැනි විශාල ඉඩම් ප්‍රමාණයක් ආයෝජකයින් 30 දෙනෙකු වෙත 2013 හා 2014 වර්ෂවලදී ලබාදී ඇති නමුත්, 2017 ජූලි 14 දින වනවිටද කිසිදු වගා කටයුත්තක් ආරම්භකර නොතිබුණි. ඉඩම් ලබාදීමට පෙර සුදුසු ඉඩම් තෝරා නොගැනීම නිසා වන සතුන්ගෙන් වගා හානි වලක්වාගත නොහැකිවී තිබීමෙන් ඉඩම් ලබාදුන් අරමුණ ඉටුවී නොතිබුණු අතර එහි දැව ඉවත් කිරීම නිසා විශාල පරිසර හානියක්ද සිදුවී තිබුණු බව නිරීක්ෂණය විය.

(ඈ) "බී" කලාපය මඟින් කෘෂි ව්‍යාපෘති සඳහා ව්‍යාපාරිකයන් 123 දෙනෙකු වෙත 2009-2014 කාලපරිච්ඡේදය තුල ලබාදී තිබුණු ඉඩම් අක්කර 1700 ක 2017 ජුනි 30 වනවිටද කෘෂි ව්‍යාපාර ආරම්භ කර නොතිබුණු අතර, වර්ෂ ගණනාවක් ගතවී තිබුණද ගිවිසුම් ප්‍රකාරව එම ඉඩම් ආපසු ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම ආයෝජකයින් 49 දෙනෙකු වෙත ඉඩම් ලබාදීම සඳහා ලබාගත් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියද විගණනයට ඉදිරිපත් නොවීය.

(එ) දිගුකාලීන බදු පදනම මත ලබාදුන් ඉඩම් සඳහා ආයෝජකයින් 149 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු.52,685,874 ක බදුකුලියක් අයවිය යුතුව තිබුණද ඒවා අයකර ගැනීමට අධිකාරිය කටයුතුකර නොතිබුණි.

(ඒ) පරිපාලිත සමාගමක් වූ මහවැලි පශු සම්පත් සහ කෘෂි ව්‍යාපාර (පුද්) සමාගම යටතේ 1999 වර්ෂයේ සිට ගොවිපලවල් 07 ක් ක්‍රියාත්මක වී තිබුණද ඉන් ගොවිපලවල් 05 ක් අධිකාරියට හා බාහිර පාර්ශවයන්ට බදු පදනමට හා සින්නකර අයිතිය පවරාදීම මත ලබාදී තිබුණද එම ගොවිපලවල් වලට අයත් රු.16,806,745 ක් වටිනා ගොඩනැගිලි හා රු.6,583,340 ක් වටිනා වාහන හා වෙනත් වත්කම් සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල තවදුරටත් දේපල, පිරියත හා උපකරණ ලෙස දක්වා තිබුණි.

**4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

**-----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජලාශයන්හි රැස්කරන ජලය විදුලිබල උත්පාදනය සඳහා නිවැරදිව ඇගයීම්කර භාවිතා කිරීමට සැලසුම් නොකිරීම හේතුවෙන් 1985 වර්ෂයේ සිට 2016 වර්ෂය අවසානය දක්වා වර්ෂාපතන කාලසීමාවන් වලදී මහවැලි ජලාශ 05 කින් ජල කියුබික් මීටර් මිලියන 19,302 ක් ජලාශවලින් පිටාර ගලා ගොස් තිබුණි. අවසානයට ජල විදුලිය නිෂ්පාදනය කරන රන්ටැඹේ සහ බෝවතැන්න ජලාශවලින් පමණක් පිටාර ගොස් ඇති ජල ප්‍රමාණය කියුබික් මීටර් මිලියන 8495 ක් වූ අතර ගණනය කිරීම්වලට අනුව එහි වටිනාකම රු.මිලියන 57,125 ක් වී තිබුණි.

(ආ) විදුලි රැහැන් පද්ධති ඉදිකිරීම විදුලිබල මණ්ඩලය විසින් කළයුතු කාර්යයක් වුවද, මාදුරු ඔය 1 හා 2 විදුලි බලාගාරවල ධාරිතාවය වැඩිකිරීම සඳහා නව විදුලි රැහැන් පද්ධතියක් ආයෝජකයෙකු විසින් රු.150,000,000 ක පිරිවැයක් දරා ඉදිකර තිබුණි. මෙම වියදම ආයෝජකයා හා අධිකාරිය අතර රාජ්‍ය භාගය බෙදාගන්නා 65.8 : 34.2 අනුපාතයට බෙදාගත යුතු බව ඒ සඳහා පත්කළ කමිටුවකින් නිර්දේශකර තිබුණි. එසේම අධිකාරියට ආයෝජකයාගෙන් ලැබෙන රාජ්‍ය භාගය හා අධිකාරිය විසින් ආයෝජකයාට ගෙවියයුතු මුදලට හිලව්කරගැනීම සඳහා මහවැලි අධිකාරිය, විදුලිබල මණ්ඩය සහ ආයෝජකයා අතර ත්‍රෛයිපාර්ශවික ගිවිසුමකට එළඹියයුතු බව අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබුණි. අදාල පාර්ශවයන් ත්‍රෛයිපාර්ශවික ගිවිසුමකට එළඹ නොතිබුණු අතර උක්ත කමිටු නිර්දේශය අනුව ආයෝජකයා දරනලද වියදමින් රු.51,300,000 ක් අධිකාරිය විසින් දැරියයුතු වුවද ඊට පටහැනිව රු.75,000,000 ක් අධිකාරියට ලැබෙන රාජ්‍ය භාගයෙන් අඩුකර ගෙන තිබුණි.

(ඇ) 1992 ජූලි 08 හා ඔක්තෝබර් 14 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීම් තීරණවලට අනුව චිත්‍රපට ස්ථාන සංකීරණයක් හා ක්‍රියාකාරී භූමියක් ඉදිකිරීම සඳහා තක්සේරු වටිනාකමින් සියයට 6 ක් හෝ උපරිමය සියයට 10 කට නොවැඩි දිගුකාලීන බදු ප්‍රතිශතයකට යටත්ව වසර 50 ක කාලයකට අධිකාරියේ දිගන පිහිටි හෙක්ටයාර් 4.23089 ක ඉඩම සහ ගොඩනැගිලි සංකීර්ණය විදේශ සමාගමක් වෙත ලබාදීමට අනුමැතිය ලබාදී තිබුණි. 1993 මැයි 21 දින සමාගම සමඟ එළඹි අවබෝධතා ගිවිසුම අනුව ගොඩනැගිලි සංකීර්ණය සහ භූමිය රු.මිලියන 20 කට තක්සේරුකර තිබුණි. අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව තක්සේරු වටිනාකමින් සියයට 6 ක බදු ප්‍රතිශතයක් යටතේ 1993 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානයට අයවියයුතු කුලිය රු.28,800,000 ක් සහ කලාපය විසින් මේ සඳහා ලබාදී තිබුණු තවත් නිවාස 11 වෙනුවෙන් අයවියයුතු බදුකුලිය රු.4,542,500 ක් සමාලෝචිත වර්ෂය අවසානවන විටද අයකර ගෙන නොතිබුණි. කෙසේ වුවද වර්තමානයේදී මෙම වත්කම් වල සන්තකය ආපසු ලබාගැනීම සඳහා අධිකාරිය විසින් අධිකරණ ක්‍රියාමාර්ග ගෙන තිබුණද ඊට අදාල තීන්දුව සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ලැබී නොතිබුණි.

(ඈ) එච් කලාපයට අයත් එප්පාවල පොස්පේට් නිදිය සහිත හෙක්ටයාර් 17.942 ක ඉඩම සඳහා රජය හා රාජ්‍ය පතල් කැනීම් හා ඛනිජ සංවර්ධන සංස්ථාව විසින් 1992 අප්‍රේල් 09 දින අත්සන් කරන ලද ගිවිසුම අනුව බදු මුදල් පළාත් ඉඩම් කොමසාරිස් වෙත ගෙවීම නිසා මෙම ඉඩමෙන් 1992 සිට 2015 වර්ෂය දක්වා කිසිදු බදු මුදලක් අධිකාරියට අයවී නොතිබුණි. පසුව අධිකාරිය 2016 /2017 වර්ෂවලදී ලංකා පොස්පේට් සමාගම සමඟ ඇතිකරගත් ගිවිසුම අනුව පොස්පේට් කියුබ් එකක් සඳහා රු.300 ක සේවා ගාස්තුවක් ගෙවීමට එකඟ වී තිබුණද, අධිකාරියේ අධීක්ෂණය යටතේ කැණීම් සිදුනොවීම නිසා සත්‍ය වශයෙන් කණිනලද පොස්පේට් ප්‍රමාණය දැනගැනීමට නොහැකි වී තිබුණි. සමාගමේ වාර්තා අනුව කියුබ් 6,011 ක් සඳහා රු.1,803,300 ක් පමණක් අයකර ගෙන තිබුණු අතර කැනීම්වලින් පසු භූමිය පුනරුත්තාපනය නොකිරීම නිසා භූමියෙහි තැනින් තැන විශාල පාෂාණ ඉතිරි වී තිබුණි.

මහවැලි බල ප්‍රදේශයේ තවත් හෙක්ටයාර් 9 ක ඇපටයිට් කැනීම් සිදුකර තිබුණද කැනීම් බලපත්‍ර පරීක්ෂාවේදී ඉඩමේ අයිතිය ප්‍රාදේශීය ලේකම්ට අයත්ව තිබුණු බව අනාවරණය වුවද මෙම තත්ත්වය නිරවුල්කර ගැනීමට කටයුතුකර නොතිබුණි.

(ඉ) මාර්ග සංවර්ධන අධිකාරියේ දක්ෂිණ අධිවේගී මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය සඳහා පස් කියුබ් 500,000 ක් පමණ සැපයීම සඳහා වලව බල ප්‍රදේශයේ මයුරපුර කොට්ඨාශයේ මහවැලි අධිකාරිය සතු ඉඩම් අක්කර 671 ක් මැනුම් සිදුකර පස් කැපීම සඳහා පුද්ගලයින් 29 දෙනෙකු වෙත අවසර පත් නිකුත් කිරීමට සැලසුම් කර දෙදෙනෙකුට කැණීම් බලපත්‍ර ලබාදී තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) මහවැලි අධිකාරියේ අභ්‍යන්තර චක්‍රලේඛ ප්‍රකාරව බලප්‍රදේශයේ ඛනිජ ද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා කලාපීය භෞතික සැලසුම් කමිටුවේ අනුමැතිය හා ඉඩම් ලබාදීම සඳහා ප්‍රධාන කාර්යාලයේ අනුමැතිය ලබාගෙන නොතිබුණු අතර මූලික පාරිසරික පරීක්ෂණ වාර්තාවක් හෝ පාරිසරික බලපෑම් තක්සේරු කිරීමේ වාර්තාවක් ලබාගෙන නොතිබුණි.

(ii) බදු පදනම මත පස් කැපීම සඳහා බදුකරුවන්ට ලබාදී තිබූ අක්කර 08 ක ඉඩම් ප්‍රමාණය 2016 මාර්තු 23 දිනැති බදුකරුගේ ඉල්ලීම අනුව නිසි අනුමැතියකින් තොරව අක්කර 50 දක්වා වැඩිකිරීමට නේවාසික ව්‍යාපාර කළමනාකරු විසින් අනුමැතිය ලබාදී තිබුණි. එසේම පාරිසරික නිර්දේශ ලබාගැනීමෙන් තොරව අවස්ථා දෙකකදී නේවාසික ව්‍යාපාර කළමනාකරු විසින් කැණීම් බලපත්‍රය දීර්ඝකිරීමද නිර්දේශකර තිබුණි.

(iii) ඉඩම් පරිහරණ සැලසුම් අධ්‍යයනයකින් හා විධිමත් පාරිසරික ඇගැයීමකින් තොරව කලාපභාර නිලධාරීන්ගේ අනුමැතිය පරිදි අනුමත සීමාව ඉක්මවා පස් කැපීම නිසා වනජීවීන්ගේ වාසභූමි අහිමිවීම , වාණිජමය වටිනාකමක් සහිත හා රහිත ශාක විනාශවීම සහ භූගත ජල මට්ටමට බලපෑමක් ඇතිවීම වැනි විවිධ පාරිසරික ගැටළු මතුවී තිබුණි. මැනුම්කරන ලද ඉඩම්වලින් අක්කර 115 ක් වන අලි කළමනාකරණ ප්‍රදේශයට අයත්ව තිබීම හේතුවෙන් ඒ සඳහා මධ්‍යම පරිසර අධිකාරිය හා වනජීවී දෙපාර්තමේන්තුවේ නිර්දේශ ලබාදී නොතිබුණි.

(iv) භූවිද්‍යා හා පතල් කාර්යාංශයේ නියමය පරිදි කැණීම් ධාරිතාව කියුබ් 1000 ක් හා කැණීම් ගැඹුර අඩි 08 කට නොවැඩි වියයුතු වුවද, අනුමැතියකින් තොරව නේවාසික ව්‍යාපාර කළමනාකරු විසින් කැණීම් ගැඹුර මීටර 15 ක් (අඩි 49) ලෙසත් කැණීම් ධාරිතාව කියුබ් 3,000 දක්වාත් වැඩිකර තිබුණි. පස් ඉවත් කිරීමෙන් පසු භූමියෙහි ජලය එකතුවන ලෙස “පතන” නිර්මාණය කිරීමට යෝජිත නමුත් එහි වපසරිය, ගැඹුර, පිහිටීම පිළිබඳ සැලැස්මක් ඉදිරිපත්කර නොතිබුණි.

(v) නිසි සැලැසුමකට අනුව ඉඩම් ලබා නොදීම නිසා අනුමත සීමාව ඉක්මවා පස් කපා තිබුණු අතර මිනුම් වාර්තාවන්ට අනුව පස් කැපීම සඳහා ලබා දී තිබුණු ස්ථාන දෙකෙන් කපා ඉවත් කර ඇති පස් ප්‍රමාණය කියුබ් 137,719 ක් වූ නමුත් පස් කියුබ් 5,000 ක් සඳහා පමණක් රු. 2,800,000 ක ඉඩම් පරිහරණ ගාස්තු අධිකාරිය වෙත ලැබී තිබුණි. වැඩියෙන් ඉවත්කර ගන්නා ලද පස් කියුබ් 132,719 ක් සඳහා ලැබියයුතු රු..85,522,640 ක් අයකරගෙන නොතිබුණි. එසේම මෙම ව්‍යාපෘතියට අවශ්‍ය පස් විධිමත් පරිදි ඉවත් කිරීමට සැලැසුම් නොකිරීම හේතුවෙන් මාර්ග

සංවර්ධන ව්‍යාපෘතිය නිමකිරීමට ඵලදායී දායකත්වයක් සැපයීමටත්, පරිසර හානිය අවම වන පරිදි පස් ඉවත් කිරීමටත්, පස් වෙනුවෙන් අධිකාරියට රු.මිලියන 280 ක පමණ ආදායමක් උපයා ගැනීමටත් තිබූ අවස්ථාව අහිමිවී තිබුණි.

(ඊ) වික්ටෝරියා - කොත්මලේ කලාපය විසින් දිගන, ඩොලමයිට් නිධිය 2005 වර්ෂයේදී මහවැලි වෙන්චර් කැපිටල් (පුද්) සමාගම වෙත බදු දී තිබුණි. 2014 වර්ෂයේදී ඩොලමයිට් නිධිය නැවත කලාපයට පවරාදීම සඳහා පත්කළ කමිටුවේ නිර්දේශ පරිදි ඩොලමයිට් ව්‍යාපෘතියේ ලියවිලි, වෙඩිබෙහෙත් ගබඩාව, අදාල බලපත්‍ර විධිමත්ව භාරගැනීමට හා සමාගම යටතේ මෙතෙක් කැණීම් කරන පුද්ගලයින්ගෙන් උක්ත සමාගමට කිසිදු මුදලක් අයවීමට නොමැති බව තහවුරු කරගෙන එම පුද්ගලයින් සමඟ ගිවිසුම් ගත වන ලෙස අධ්‍යක්ෂ ජනරාල් විසින් 2014 සැප්තැම්බර් 17 දින කලාපයේ නේවාසික ව්‍යාපාර කළමනාකරු වෙත දන්වා තිබුණද 2017 දෙසැම්බර් 31 දින වන විටද ඒ අනුව කටයුතුකර නොතිබුණි.

## 4.5 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

-------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) දෛනික වියදම් සඳහා ප්‍රමාණවත් මුදලක් අතරදවාගෙන ඉතිරි මුදල් ආයෝජනය කිරීම සඳහා අවධානය යොමුකිරීමකින් තොරව සමාලෝචිත වර්ෂය අවසානයට ප්‍රධාන කාර්යාලය හා කලාප 11 ක එකතුව රු.254,043,270 ක් අතැති මුදල් ලෙස රඳවාගෙන තිබුණි.

(ආ) කලාප 06 ක හා අධිකාරියේ එක් අංශයක රු. 131,696,730 ක් වටිනා නිෂ්කාර්යව පවතින ගොඩනැගිලි 442 ක් අතරින් භාවිතයට ගත නොහැකි ගොඩනැගිලි 262 ක් පාවිච්චියට සුදුසු ගොඩනැගිලි 34 ක් හා අලුත්වැඩියා කර නැවත භාවිතා කළ හැකි ගොඩනැගිලි 146 ක් පවතින බැවින් එම ගොඩනැගිලි තවදුරටත් විනාශවීමට පෙර අලුත්වැඩියා කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) නිරාවිය ගොවිපලේ ලොරි 02 ක්, ට්‍රැක්ටර් 03 ක් , නිවාස 04 ක්, ගොඩනැගිලි 02 ක්, කුකුළු කොටු 12 ක්, ඌරු කොටු 05 ක්, එළගාලක් සහ කුකුළු මස් නිපදවන ස්ථානයක් නිශ්කාර්යව පැවතුණු බැවින් එම වත්කම් අපහරණය කිරීමට හෝ ප්‍රයෝජනයට ගැනීමට විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) පොල්ගොල්ලේ පිහිටා තිබූ භූගෝලීය තොරතුරු පද්ධති ( GIS ) අංශය 2007 වර්ෂයේදී කොත්මලේ පරිසර හා වන සංරක්ෂණ අංශයට මාරුකර තිබීම නිසා අංශය සතුව පැවතුණු පරිගණකයක් , ලැප්ටොප් එකක්, ජීපීඑස් උපකරණ 03ක්, මේස 06ක්, පුටු 07ක්, ප්‍රින්ටර් 03ක්, ලිපිගොනු කබඩ් 06 ක්, ඩිජිටල් කැමරාවක්, ඩිජිටල් සේප්පුවක්, ස්කැනර්යක් නිෂ්කාර්යව පැවතුණි.

(ඉ) අධිකාරිය සතුව වැලිඔය කලාපයේ රු.9,953,619 ක් වටිනා කාමර 10 ක සංචාරක බංගලාවක් හා තවත් ගොඩනැගිල්ලක්ද "බී" කලාපයේ දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘතියට අයත් රු.5,492,833 ක් වටිනා ප්‍රාථමික පාසැල් ගොඩනැගිල්ල හා වැසිකිලි පද්ධතිය 2015 වර්ෂයේ සිට ප්‍රයෝජනයට ගැනීමෙන් තොරව නිෂ්කාර්යව පැවතුණි.

(ඊ) මහවැලි එච් කලාපයේ රු.1,484,500 ක් වටිනා ගොයම්පැල සිටුවන හා වල්පැල ගලවන යන්ත්‍ර 10 ක් 2016 වර්ෂයේ සිට නිෂ්කාර්යව පවතින අතර වැලිඔය කලාපයේ ගවයින් 20 ක් ගාල්කිරීමට ඉදිකළ ගවගාලක් තුල ගවයින් 6 ක් පමණක් ගාල් කර ඇති බව භෞතික පරීක්ෂාවේදී තහවුරු විය.

(උ) වැලිඔය ප්‍රදේශයේ නැවත පදිංචි කළ ජනතාවට බෙදාදීම සඳහා 2013 වර්ෂයේදී මිලදීගත් එකතුව රු.6,513,390 ක් ක් වටිනා උපකරණ හා ද්‍රව්‍ය අයිතම් 6,409 ක් හා 1992, 2015 හා 2016 වර්ෂවල මිලදී ගෙන තිබුණු රු. 2,425,065 ක් වටිනා ලී බඩු හා උපකරණ එල් කලාපයේ ගබඩාවක් තුල හා සංචාරක බංගලාවක් තුල නිශ්කාර්යව පැවතුණි.

(ඌ) මහවැලි අධිකාරියේ "සී" කලාපය විසින් මහවැලි පශු සම්පත් සහ කෘෂි ව්‍යාපාර (පුද්) සමාගමට අයිති ගිරාදුරුකෝට්ටේ ගොවිපල සත්ව පාලන පුහුණු මධ්‍යස්ථානයක් බවට පරිවර්තනය කිරීමේ අරමුණින් 2014/2015 වර්ෂවලදී රු.12,501,900 ක් වැයකර ඉදිකරනලද ගවගාල්, එළුගාල් ඇතුළු ඉදිකිරීම් හා භාණ්ඩ රු.8,967,600 කට අගයකර 2016 පෙබරවාරි 08 දින පශුසම්පත් හා කෘෂි ව්‍යාපාර සමාගමට පවරා දී තිබුණි. මෙම ඉදිකිරීම් හා භාණ්ඩ ප්‍රයෝජනයට ගැනීම සඳහා නිශ්චිත සැලසුමක් හෝ ක්‍රමවේදයක් සමාගම සතු නොවූ බැවින් පවරා දුන් දිනයේ සිට එම වත්කම නිෂ්කාර්යව දිරාපත් වෙමින් තිබුණි.

(එ) මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යාපාර සමාගම සතු ගිරාදුරුකෝට්ටේ අක්කර 1,054 ක පමණ වූ ගොවිපල භූමියෙහි කිසිදු බෝගයක් වගා කර නොතිබූ අතර, සත්ත්ව පාලන කටයුතුද සුළු වශයෙන් සිදුකිරීම හේතුවෙන් භූමිය ඌන උපයෝජිතව පැවතුණි. තවද එහි පැවති කිරි ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තශාලාවෙහි රු.2,720,000 ක් වටිනා ස්ථාවර වත්කම් 2013 වර්ෂයේ සිට නිෂ්කාර්යව පැවතුණු අතර පිරිවැය රු.2,056,000 ක් වූ අබලන් වාහන 06 ක් හා යන්ත්‍රයක් ගිරාදුරුකෝට්ටේ ගොවිපල කාර්යාල භූමියෙහි නිෂ්කාර්යව තබා තිබුණි.

## 4.6 හඳුනාගන්නා ලද පාඩු

---------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මහවැලි උපදේශක සේවා කාර්යාංශ ( පුද්ගලික ) සමාගම විසින් 2000 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා වූ කාලසීමාවට අදාලව එකතු කළ අගය මත බදු , ජාතිය ගොඩනැගීමේ බදු සහ උපයන විට ගෙවීම් බදු දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත නිසි පරිදි ප්‍රේෂණය නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේදී සමාගමට රු. 1,810,836 ක දඩ මුදලක් ගෙවීමට සිදුවී තිබුණි. තවද නියමිත කාලසීමාව තුළ ලාභාංශ ප්‍රකාශ නොකිරීම හේතුවෙන් 2015 වර්ෂයේ ලාභයට අදාලව සමාලෝචිත වර්ෂයේදී රු.55,807 ක ලාභාංශ මත බද්දක් ( Deemed dividend tax ) ගෙවීමට සිදු වී තිබුණි.

(ආ) මහවැලි "එල් " කලාපය විසින් ජනපදිකයින් සඳහා ඉදිකර තිබුණු නළ ළිංවලින් ජලය පොම්පකිරීමට අවශ්‍ය විදුලිය ලබාගැනීමට විදුලි බල මණ්ඩලය වෙත 2016 දෙසැම්බර් 30 දින ලියන ලද රු.25,202,879 ක් වටිනා චෙක්පත් දෙකක් නිකුත් නොකර ළඟ තබාගෙන 2017 මාර්තු 24 දින නිකුත් කර තිබුණි. 2017 වර්ෂයේදී ඇස්තමේන්තු මිලගණන් වැඩි වී තිබුණු බැවින් මණ්ඩලය වෙත ගෙවියයුතු එම ගෙවීම් ප්‍රමාදවීම හේතුවෙන් නව ඇස්තමේන්තු මිල ගණන් මත ගෙවීමට සිදුවීම නිසා රු. 2,121,320 ක අමතර මුදලක් ගෙවීමට සිදු වී තිබුණි.

**4.7 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත රු.466,312,000 ක කොන්ත්‍රාත් වටිනාකමකට වැලිඔය ගජබාපුර ග්‍රාමයේ සිට නැදුන්කර්නි නගරය දක්වා මාර්ගය 2016 දෙසැම්බර් 08 දින සිට මාස 06 කින් ඉදිකර මහවැලි අධිකාරියට භාරදීමට එකඟ වෙමින් අධිකාරිය විසින් මාර්ග සංවර්ධන අධිකාරිය සමඟ කොන්ත්රාත් ගිවිසුමකට එළඹ තිබුණි. 2017 අප්‍රේල් වන විට කොන්ත්‍රාත් මුදලින් රු.390,085,714 ක් ගෙවා තිබුණු අතර 2017 ජූලි 11 දින සිදුකල භෞතික පරීක්ෂාවේදී කැලෑ ප්‍රදේශය එළිකර කුඩා පාලම්/බෝක්කු 23 ක් පමණක් ඉදිකර තිබුණු බව නිරීක්ෂණය විය. කෙසේ වුවද 2017 ජුනි 08 දින ඉදිකිරීම් අවසන්කළ යුතු මෙම කොන්ත්‍රාත් කාර්යය අවසන් කර නොතිබුණද ඒ සම්බන්ධයෙන් ගිවිසුම් ප්‍රකාරව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) වැලිඔය කලාපයේ වගා ළිං ඉදිකිරීම සඳහා ජල භූ විද්‍යා සමීක්ෂණයක් ( ශක්‍යතා අධ්‍යයනයක් ) සිදුකිරීම සඳහා රජරට විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයට රු.2,530,000 ක් 2014 වර්ෂයේදී ගෙවීම්කර තිබුණි. එමගින් ස්ථාන 48 ක වගා ළිං/කෘෂි ළිං ඉදිකිරීමට නිර්දේශ කර සෙසු ස්ථාන 32 සඳහා නිසි අධ්‍යයනයකින් අනතුරුව නල ළිං ඉදිකිරීම යෝග්‍ය බවට නිර්දේශ කර තිබුණි. කෙසේ වුවද 2014 හා 2015 වර්ෂවලදී රු.4,203,200 ක් වැය කර තිබුණු ළිං 17 ක ඉදිකිරීම් අතර මඟ නතර කර තිබුණි.

(ඇ) වැලිඔය කලාපයේ 2014 වර්ෂයේදී නළ ළිං ( Bore hole ) 25 ක් හා 2015 හා 2016 වර්ෂවල නළ ළිං 40 ක් ඉදිකිරීම, ජලධාරිතා සහ ජල සාම්පල් පරීක්ෂණ සිදුකිරීම, ඒ සඳහා අවශ්‍ය ජල ටැංකි රඳවන 25 ක් ඉදිකිරීම (වතුර පොම්ප සහිතව) සඳහා සමාලෝචිත වර්ෂය අවසන් වන විට එකතුව රු. 46,412,996 ක් වැය කර තිබුණද 2017 අගෝස්තු 21 දින වන විටත් එම ළිංවල ජලය භාවිතා කිරීමට හැකි ආකාරයට වැඩ අවසන් කර නොතිබුණි. තවද මෙම ව්‍යාපෘතියේ ප්‍රතිලාභ ලබාගැනීම සඳහා අවශ්‍ය විදුලිය ලබාගැනීමට හා ජල ටැංකි රඳවන සඳහා තවදුරටත් රු.73,205,264 ක් දැරීමට සිදුවන බව නිරීක්ෂණය විය.

(ඈ) ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව සමාලෝචිත වර්ෂයේදී මහවැලි පශු සම්පත් සහ කෘෂි ව්‍යාපාර (පුද්) සමාගම රු.8,407,159 ක් වටිනා කුකුළු කෑම හා රු.2,278,000 ක් වටිනා කුකුළු පැටවුන් 19,000 ක් මිලදී ගෙන තිබුණි. පැටවුන් විවිධ ආයතනවලින් මිලදී ගැනීම හේතුවෙන් පැටවෙකුගේ මිල රු.70 සිට රු.155 ක් දක්වා පරාසයක මිල විචලනයන් නිරීක්ෂණය විය.

**4.8** වාහන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරිය සතුව වාහන 881 ක් පැවති අතර ඉන් වාහන 790 ක් වර්ෂ 20 කට වඩා පැරණි වාහන වීම හේතුවෙන් වාහන අලුත්වැඩියා හා නඩත්තු වියදම පිළිවෙලින් ඉකුත් වර්ෂයේ රු. 67,800,000 ක් හා සමාලෝචිත වර්ෂයේ රු.102,600,000 ක් විය. අලුත්වැඩියා හා නඩත්තු වියදම් වැඩි පැරණි වාහන ඉවත්කිරීමට හෝ ඒ සම්බන්ධයෙන් වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් නොගැනීම නිසා ඉකුත් වර්ෂයට වඩා සමාලෝචිත වර්ෂයේදී රු.34,800,000 කින් හෙවත් සියයට 51.3 කින් අලුත්වැඩියා හා නඩත්තු වියදම වැඩිවී තිබුණි.

(ආ) මූලික වැඩපාලන ක්‍රියාකරවුම් හා නඩත්තු අංශයේ 2008 වර්ෂයේ සිට අක්‍රියව පැවතුණු වාහන 12 ක් 2010 සහ 2014 වර්ෂවලදී අපහරණය කිරීමට හා ටෙන්ඩර් මඟින් විකිණීමට කටයුතුකරන ලෙස එම අංශයේ අධ්‍යක්ෂ විසින් දන්වා තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඇ) අධිකාරිය විසින් බාහිර පාර්ශවයන්ට අයිති වාහන 22 ක් ප්‍රයෝජනයට ගනිමින් පැවතියද එම වාහනවල අයිතිය නිරවුල් කර අධිකාරියට පවරා ගැනීමට කටයුතුකර නොතිබුණි.

**4.9** ප්‍රමාද වූ ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මහවැලි අධිකාරියේ වැලිඔය ප්‍රදේශයේ ක්‍රියාත්මක කිරීමට යෝජිත කිවුල්ඔය ජලාශ ව්‍යාපෘතිය සඳහා 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා රු.මිලියන1,775 ක් ප්‍රතිපාදන වෙන්කර තිබුණද ව්‍යාපෘතිය ආරම්භ කිරීම සඳහා පාරිසරික අනුමැතිය ලබා ගැනීමට නොහැකි වූ බැවින් එය ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි. එම ජලාශ ව්‍යාපෘතිය සඳහා වෙන්කල ප්‍රතිපාදනවලින් රු.මිලියන 182 ක් අධිකාරියේ වැලිඔය කලාපය විසින් ක්‍රියාත්මක කරන වැලිඔය ඒකාබද්ධ ව්‍යාපෘතියේ කාර්යයන් වූ පිවිසුම් මාර්ග, ගම්මාන සංවර්ධනය, යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා වැයකර තිබුණි.

(ආ) ජනපදිකයින්ට පිරිසිදු ජලය සැපයීමට අවශ්‍ය ජල පිරිපහදු යන්ත්‍ර සවිකර වසර 10 ක් නඩත්තු කිරීම සඳහා රු.මිලියන 30 ක මුදලකට 2015 සැප්තැම්බර් 11 දින ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව සමඟ අධිකාරිය ගිවිසුමකට එළඹ තිබුණි. ගිවිසුම් ප්‍රකාරව 2015 නොවැම්බර් 30 දිනට පෙර තෝරාගත් ස්ථාන 12 ක ජල පිරිපහදු යන්ත්‍ර සවිකර අවසන් කළ යුතු වුවද 2017 වර්ෂය අවසන් වන විටත් ස්ථාන තුනක වැඩ කටයුතු අවසන් කර නොතිබුණි.

## 4.10 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් අධිකාරියේ සම්පත්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මහවැලි ආරක්ෂක බලකායේ ආරක්ෂක නිලධාරීන් 40 දෙනෙකු 2012 වර්ෂයේ දී රාජ්‍ය ආයතනවලට මුදාහැර තිබුණු අතර එම නිලධාරීන් සඳහා සමාලෝචිත වර්ෂයේදී අධිකාරිය විසින් රු.29,976,062 ක වැටුප් හා 2015 හා 2016 වර්ෂවල රු.18,720,252 ක අතිකාල හා ගමන් වියදම් ද ගෙවා තිබුණද 2017 සැප්තැම්බර් 30 දින දක්වාම අදාල ආයතන වෙතින් එම මුදල් ප්‍රතිපූර්ණය කරගැනීමට කටයුතුකර නොතිබුණි.

(ආ) අධිකාරියේ හුරුළුවැව කලාපයේ කළමනාකරණ සහකාරවරයකු සහ රියදුරකු රේඛීය අමාත්‍යාංශය වෙත අනුයුක්ත කර අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂයේදී රු. 697,324 ක වැටුප් ගෙවා තිබුණද එම මුදල් ප්‍රතිපූරණය කර ගෙන නොතිබුණි.

## 4.11 කාර්ය මණ්ඩලය පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ පුරප්පාඩු 12 ක්, මධ්‍යම කළමනාකරණ මට්ටමේ පුරප්පාඩු 169 ක් හා 118 ක අතිරික්ත කාර්යමණ්ඩලයක් විය. අනුමත නොවූ තනතුරු සඳහා තාවකාලිකව බඳවාගෙන තිබුණු 41 දෙනෙකු අතිරික්ත කාර්යමණ්ඩලයට ඇතුළත් වී තිබුණි.

(ආ) නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා මුදල්), අධ්‍යක්ෂ (ඉඩම්), අධ්‍යක්ෂ (සැලසුම් හා නියාමන) , අධ්‍යක්ෂ (මහවැලි කේන්ද්‍රය) හා "සී", "බී" හා හුරුළුවැව කලාපවල නියෝජ්‍ය නේවාසික ව්‍යාපාර කළමනාකාර යන තනතුරු සඳහා බඳවාගැනීමේ පරිපාටිය ප්‍රකාරව සුදුසු නිලධාරීන් ස්ථිර පදනමින් බඳවා ගැනීමට කටයුතු නොකර පුරප්පාඩු වූ තනතුරුවල රාජකාරි ආවරණය කිරීම සඳහා කොන්ත්‍රාත් පදනමින් හා ද්විතීක පදනමින් නිලධාරීන් බඳවා ගෙන තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට අධිකාරියේ නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයෙකු, සමාජ විද්‍යාඥයෙකු, භූ විද්‍යාඥයෙකු, ඉංජිනේරුවරුන් 40 දෙනෙකු , ඉංජිනේරු සහකාරවරු 13 දෙනෙකු, කාර්මික නිලධාරීන් 12 දෙනෙකු හා කළමනාකරණ සහකාර 51 දෙනෙකු ඇතුළු නිලධාරීන් 369 ක කාර්යමණ්ඩලයක් වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයට සහ මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශවලට අයත් ව්‍යාපෘතිවලට අනුයුක්තකර තිබුණි. එසේ නිලධාරීන් නිදහස් කිරීම නිසා අධිකාරියේ අනුමත කාර්යමණ්ඩලයේ තනතුරුවල සේවය කිරීමට එකී නිලධාරීන්ට නොහැකි වන අතර එම නිදහස්කරන කාර්යමණ්ඩලයේ තනතුරුවල පුරප්පාඩුද නොමැතිවීම හේතුවෙන් බැවින්, එම තනතුරුවලට නවක නිලධාරීන් බඳවා ගැනීමටද නොහැකිවී තිබුණි.

(ඇ) ස්වාභාවික සම්පත් කළමනාකරණ සේවා (පුද්) සමාගම හා මහවැලි උපදේශක සේවා කාර්යාංශ (පුද්) සමාගම සඳහා නිශ්චිත කාර්යමණ්ඩලයක් හා ඊට අදාලව බඳවාගැනීමේ කාර්ය පරිපාටියක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් හෝ අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් හෝ අනුමත කරගෙන නොතිබුණි.

(ඉ) වෙනත් අමාත්‍යාංශයක ස්ථිර පත්වීමක් දරන අයෙක් මහවැලි උපදේශක සේවා කාර්යාංශ (පුද්ගලික) සමාගමේ ලේකම් ලෙස කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන තිබුණු අතර විධිමත් සම්මුඛ පරීක්ෂණයක් නොපවත්වා ගණකාධිකාරී තනතුර සඳහා ස්වාභාවික සම්පත් කළමනාකරණ සේවා (පුද්) සමාගම විසින් කොන්ත්‍රාත් පදනමින් නිලධාරිනියක් බඳවාගෙන තිබුණි.

(ඊ) 2010 ඔක්තෝබර් සිට රේඛීය අමාත්‍යාංශය යටතට ගෙන තිබුණු මහවැලි පශු සම්පත් සහ කෘෂි ව්‍යාපාර (පුද්) සමාගම සතු නිරාවිය ගොවිපලට අනුයුක්ත සමාගමේ සේවකයින් 06 දෙනෙකුගේ වැටුප්, සේවක අර්ථසාධක හා සේවක භාරකාර අරමුදල්වල දායක මුදල් අමාත්‍යාංශය විසින් හා වර්තමානයේදී මහවැලි අධිකාරිය විසින් ගෙවමින් පැවතුණද මෙම සේවකයින් විධිමත් පරිදි මුදාහැරීමට සමාගම කටයුතුකර නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

----------------------------------------

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

----------------------------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණනය වෙත ඉදිරිපත් කළ යුතු වුවද මහවැලි උපදේශක සේවා කාර්යාංශ (පුද්) සමාගම හා ස්වාභාවික සම්පත් කළමනාකරණ සේවා ( පුද්) සමාගම විසින් 2017 ජූනි මාසයේදී හා අධිකාරිය විසින් 2017 දෙසැම්බර් 04 දින විගණනය සඳහා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණද ඒ සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි.

### 5.2 සංයුක්ත සැලැස්ම

--------------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 1/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව සංයුක්ත සැලැස්ම සකස් කළයුතු වුවද සමාලෝචිත වර්ෂයේ සංයුක්ත සැලැස්ම සකස්කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි. තවද මහවැලි පශු සම්පත් සහ කෘෂි ව්‍යාපාර (පුද්) සමාගම හා ස්වාභාවික සම්පත් කළමනාකරණ සේවා (පුද්) සමාගම විසින් තම අරමුණු ඉටුකරගැනීම සඳහා ඉදිරි සැලසුම් ඇතුළත්කර සංයුක්ත සැලැස්මක් සකස්කර නොතිබුණි.

## 5.3 ක්‍රියාකාරී සැලැස්ම

-------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 1/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව සකස්කළයුතු වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස්කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ කාර්යසාධනයට අනුකූලව සකස් කරන ලද සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම 2016 දෙසැම්බර් 29 දින අධ්‍යක්ෂ මණ්ඩල විසින් අනුමත කර තිබුණි. ක්‍රියාකාරී සැලැසුමට අනුව සකස් කරන ලද අධිකාරියේ කාර්යසාධන වාර්තාව 2018 ජනවාරි 10 වන දින වනවිටද විගණනයට ලබා දී නොතිබුණි.

(ආ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ කාර්යයන් නිසි පරිදි මෙහෙයවීම සඳහා මහවැලි පශු සම්පත් සහ කෘෂි ව්‍යාපාර (පුද්) සමාගම හා ස්වාභාවික සම්පත් කළමනාකරණ සේවා (පුද්) සමාගම විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැසුම් සකස්කර නොතිබුණි.

## 5.4 අභ්‍යන්තර විගණනය

-------------------------

2010 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වසර 05 කට අධික කාලයක් පුරප්පාඩුවී පැවතුණු අධිකාරියේ අභ්‍යන්තර විගණන (අධ්‍යක්ෂ) තනතුරෙහි 2015 වර්ෂයේ සිට ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් රාජකාරි ඉටුකරමින් සිටින අතර බඳවාගැනීමේ පරිපාටියේ සඳහන් සුදුසුකම් සම්පූර්ණකරන ලද නිලධාරියෙකු එම තනතුර සඳහා බඳවාගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වනවිටද අධිකාරිය අපොහොසත් වී තිබුණි.

## 5.5 අයවැය ලේඛනමය පාලනය

------------------------------------

ස්වාභාවික සම්පත් කළමනාකරණ සේවා (පුද්) සමාගම විසින් සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ලේඛනයක් සකස්කර නොතිබුණු අතර අධිකාරියේ, මහවැලි උපදේශක සේවා කාර්යාංශ (පුද්) සමාගමේ හා මහවැලි පශු සම්පත් සහ කෘෂි ව්‍යාපාර (පුද්) සමාගමේ අයවැයගත හා තත්‍ය වියදම අතර විචලනය පිළිවෙලින් සියයට 10 සිට සියයට 582 දක්වාත් සියයට 11 සිට සියයට 121 දක්වාත් හා සියයට 14 සිට සියයට 100 දක්වාත් වී තිබුණි. ඒ අනුව අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 5.6 නොවිසඳී ඇති විගණන ඡේද

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ලංකා විදුලිබල මණ්ඩලයේ මුළු ජල විදුලිබල නිෂ්පාදනයෙන් සියයට 50 ක් පමණ මහවැලි ජලාශ ආශ්‍රිතව ඉදිකර ඇති ජල විදුලිබලාගාර මඟින් නිපදවන අතර, පොල්ගොල්ල, වික්ටෝරියා සහ කොත්මලේ යන ජලාශවල වේලි මත වූ විදුලි පහන් සඳහාද අධිකාරිය විසින්

ලංකා විදුලිබල මණ්ඩලයට විදුලි ගාස්තු ගෙවන බව නිරීක්ෂණය විය. ජලාශ නඩත්තුව හා විදුලිබල මණ්ඩලය ප්‍රයෝජනයට ගන්නා ජලය වෙනුවෙන් ගාස්තු ගෙවීමක්ද සිදුනොකරන බැවින්, මෙම ප්‍රධාන වේලිවල විදුලි අවශ්‍යතාවය නොමිලේ සපයා ගැනීමට අධිකාරිය විසින් අවධානය යොමු කර නොතිබුණි.

(ආ) පොල්ගොල්ල, කොත්මලේ, බෝවතැන්න, මාපාකඩ, මාදුරුඔය හා වික්ටෝරියා ජලාශ ආශ්‍රිත රක්ෂිත භූමි භාග තුළ අනවසර පදිංචිකරුවන් 655 දෙනෙක් සිටින බව හෙළිදරව් වූ අතර, මෙම අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමට හා නැවත පදිංචිවන අනවසර පදිංචිකරුවන් පැමිණීම වැළැක්වීමට අධිකාරිය අපොහොසත්වී තිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

---------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතාවයන් වරින් වර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර පිළිබඳව අධිකාරියේ විශේෂ අවධානය යොමු කළයුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් කළමනාකරණය | වත්කම්වල පැවැත්ම තහවුරුකර ගැනීම සඳහා වාර්ෂික වත්කම් සත්‍යාපනය සිදුකර තිබුණද අදාල වාර්තා ඉදිරිපත් කර නොතිබීම, නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම් සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග නොගැනීම. |
| (ආ) | ඉඩම් හා ගොඩනැගිලි උපයෝජනය | බාහිර පාර්ශවයන් විසින් අධිකාරියට අයත් ගොඩනැගිලි, කුලී රහිතව ප්‍රයෝජනයට ගැනීම, කලාපවල ගොඩනැගිලි නිශ්කාර්යව පැවතීම හා ඛණිජ සම්පත් සහිත ඉඩම් නිසි පරිදි කළමනාකරණය කර ආදායම් උපයා ගැනීමට කටයුතු කර නොතිබීම. |
| (ඇ) | ආදායම් හා වියදම් කළමනාකරණය | බදු ආදායම හා හිඟ බදු ආදායම රැස්කිරීම සඳහා නිවැරදි ක්‍රමවේදයක් නොතිබීම හා බදු ආදායම් රැස්කිරීමට අදාල නියමයන් හා කොන්දේසි ක්‍රියාත්මක කර නොතිබීම, මුදල් රෙගුලාසි ප්‍රකාරව ලබාගත් අත්තිකාරම් පියවා නොතිබීම. |
| (ඈ) | කොන්ත්‍රාත් පරිපාලනය | දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන මණ්ඩලයකින් අනුමැතිය ලබාගතයුතුව තිබුණු කොන්ත්‍රාත් සඳහා ප්‍රාදේශීය ප්‍රසම්පාදන මණ්ඩලය මගින් අනුමැතිය ලබාගත හැකිවන පරිදි කිසිදු පදනමකින් තොරව අදාල කොන්ත්‍රාත් කාර්යයන් කොටස්කර ලංසු කැඳවා තිබීම. |
| (ඉ) | ව්‍යාපෘති කළමනාකරණය | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට පෙර පරිසර ඇගයීම් වාර්තා හා අනෙකුත් අදාල ආයතන වලින් ලබාගත යුතු අනුමැතීන් ලබා නොගැනීම. |
| (ඊ) | වාහන පාලනය | බාහිර පාර්ශවයන් වෙත නිදහස් කර තිබුණු වාහන ආපසු ලබා ගැනීමට කටයුතු නොකිරීම හා වාහන සම්බන්ධයෙන් වාර්ෂික සමීක්ෂණ සිදුකර නොතිබීම. |